# තත්කාලීන ජනතාව බුදුදහම කෙරෙහි නැඹුරුකරවා ගැනීමෙහි ලා මහනුවර සම්ප්‍රදායේ අපාය බිතුසිතුවම්වල දායකත්වය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

**කල්පනී ඩබ්.ඩී.**[1]

මහනුවර සම්ප්‍රදායේ සිතුවම් වලට තෝරාගැණුනු තේමාවන් රාශිය අතරේ අපාය; සිතුවම්කරණයෙහිලා යොදාගෙන තිබෙන අතිශය සුවිශේෂ තේමාවක් බව සැළකිය හැකිය. මෙම සිතුවම් ශ්‍රී ලංකාවේ සිතුවම් කලාවේ එක්තරා කාල වකවානුවක් නියෝජනය කරන අතර මෙම සිතුවම් මගින් සමකාලීන සමාජීය ලක්ෂණ පැහැදිලිව මූර්තිමත් වීම විශේෂත්වයකි. මහනුවර යුගයේ ලක්ෂණ සහිත බැවින් මෙම සිතුවම් මහනුවර සම්‍ප්‍රදායට අයත් වන අතර මෙම සිතුවම් පහතරට විහාරස්ථානවල වැඩි වශයෙන් දැකිය හැකිය. 18 වන සියවස වන විට ශ්‍රී ලංකාවේ උඩරට රාජධානිය ද්‍රවිඩ බලපෑමට ලක්වීම හා පහතරට ප්‍රදේශ විදේශිකයන්ගේ ග්‍රහණයට නතුවීම, ශ්‍රී ලංකීය සංස්කෘතිය, කලාව, බුදුදහම පිරිහීමට හේතු විය. උඩරට රාජ්‍ය තුළ හින්දු දේව සංකල්පය පැතිර ගිය අතර බෞද්ධාගම කෙරෙහි නායක්කාර් වංශික පාලකයන්ගේ අවධානය හීන වී යාම උඩරට ප්‍රදේශවල බුදුසසුන බරපතල ලෙස හානියට පත්වීමට හේතු වුණි. මීට සමගාමීව මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ විදේශිකයන් සිය ආගම ප්‍රචාරය කිරීමට දරන ලද ප්‍රයත්නයන් හමුවේ පහතරට ප්‍රදේශ වලද බුදුදහම සිසු ලෙස පරිහානියට පත් වුණි. ශ්‍රී ලංකාව යටත් කරගත් විදේශිකයන් සිය බලය යොදාගෙන සිංහලයන් බලෙන් ක්‍රිස්තියානි ආගම ඇදහීමට පොළඹවා ගන්නා ලදි. ඔවුන් සිංහලයන් තුළ පස් පව් වලට තිබූ බිය නැති කර දමන ලද අතර බීමට හා සල්ලාලකමට ඇබ්බැහි කරන ලදි. පිරිහුණු සමාජයක සිටි තත්කාලීන ජනතාව අපාය සිතුවම් මගින් නැවත බුදුදහම කෙරෙහි නැඹුරු කරවා ගැනීම කෙසේ සිදු වූයේද යන්න මෙහි පර්යේෂණ ගැටලුව ලෙස හඳුනාගත හැකිය. 18 වන සියවසේ මැද භාගයේ වැලිවිට සංඝරාජ හිමියන්ගේ මූලිකත්වය මත ආරම්භ වූ බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ බලපෑම විදේශිකයන්ගේ පාලනය මධ්‍යයේ වුවද පහතරට ප්‍රදේශවලටද ගලා එන ලදි. මෙහි බලපෑම මත පහතරට ප්‍රදේශයන්හි දුශ්ශීලයන්ව සිටි ජනතාව ඉන් මුදවා ගැනීමට, පස් පවෙහි, දස අකුසලයෙහි ආදීනව දැක්වීමට වක්‍රාකාරයෙන් දැරූ ප්‍රයත්නයක සේයාවන් අපාය දර්ශන වලින් විද්‍යාමාන වේ. මෙම සිතුවම් වල දැක්වෙන අපාය දර්ශන සැළකීමේදී සුරාපානය කිරීම හා පරදාර සේවනයට අදාළව බෞද්ධ ධර්මයේ එන අපාගත වීම්; එනම් ලෝකුඹු නරකය හා ඉඹුල්වන නරකය බහුලව දක්නට ලැබීමෙන්, ජනයා පස් පවෙන් මුදවීම මෙහි අරමුණ වූ බව පැහැදිලි වේ. බෞද්ධයන් මෙන්ම අන්‍යාගමිකයන් වුවද අපාය දර්ශන දැකීමෙන් බියපත් වන තරම් භයංකර අයුරින් අපාය දර්ශන සිතුවම් කොට ඇත. විහාර ගෙයෙහි බිත්ති තීරුවලට බෙදා පහළම තීරුවේ පමණක් අපාය සිතුවම් කොට තිබීමෙන් අපාය සිතුවම් වලට පහත් තත්ත්වයක් ලබා දී තිබෙන බව පැහැදිලිය.

**ප්‍රමුඛ පද :** අපාය දර්ශන, පහතරට විහාරස්ථාන, පිරිහුණු සමාජය, බියගැන්වීම, මහනුවර සම්ප්‍රදාය

[1]ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යනාංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. wdkalpani@gmail.com